# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/79 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වසරේ මාර්තු මස 10 වැනි දින පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් පරිදි තීරණය කර ඇති බව මෙයින් දැනුම්දෙමි.

**සුබ්‍රමානියම් සුරේන්,**
සභාපති,
පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 28 වැනි දින,
පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභා කාර්යාලය,
පලේයි.

**අංක 16 හා 2022.03.10 දිනැති තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදය සමග කියවිය යුතු 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පිළියෙල කරනු ලැබ 2018.05.09 දිනැති අංක 2070/11 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරනු ලැබූ උතුරු පළාත් සභාව විසින් 2018.09.11 වැනි දින අනුමත කරන ලද 2018.10.08 දිනැති අංක 2092/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* වැනි කොටසේ පළකරනු ලද්දා වූ ද අධිකාරය අංක 07 සිට අංක 09 දක්වා වූ උතුරු පළාතේ ප්‍රාදේශීය සභාවන් සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථා, *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට පිළිගැනීමට හා පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට ඉහත කී 1952 වසරේ අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පච්චිලෛපල්ලි ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇත.

EOG 04-0002

1A - PG 5801 — 13 (2022/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*